නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. - PQ118 හි (මින් මතුවට "බැංකුව" යනුවෙන් හැඳින් වේ) විවෘත කර පවත්වාගෙන යනු ලබන නේෂන්ස් මැක්ස් බෝනස් ඉතුරුම් ගිණුම් පහත සඳහන් නියමයන් සහ කොන්දේසි මගින් පාලනය වේ.

1. බැංකුව විසින් අනන්‍යතාවය තහවුරු කළ හැකි ලේඛනයක් (උදා: : ජාතික හැඳුනුම් පත, වලංගු ගුවන්ගමන් බලපත්‍රය, රියදුරු බලපත්‍රය) මත සහ ලිපිනය තහවුරු කළ හැකි ලියවිල්ලක් (උදා: : මෑතකදී නිකුත් කරන ලද උපයෝගිතා බිල්පතක්, බැංකු ප්‍රකාශයක්) මත පදනම්ව බැංකුව විසින් පිළිගනු ලබන පුද්ගලයකු / පුද්ගලයන් විසින් ගිණුම විවෘත කළ හැකිය.

2. ගිණුමක් පහත සඳහන් පුද්ගලයින් විසින් විවෘත කළ හැකිය.

(අ) තනි පුද්ගලයෙක්, ඔහුගේ හෝ ඇයගේ නමින්

(ආ) මැන්ඩේට් හි මුදල් ආපසු ගැනීමේ බලය පිළිබඳ පැහැදිලි උපදෙස් සඳහන් කර තිබීමට යටත්ව, පුද්ගලයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් විසින් ඔවුන්ගේ නම්වලින් බද්ධ ගිණුමක් වශයෙන්

(ඇ) බැංකුවට පිළිගත හැකි සීමාසහිත වගකීම් සමාගමක, සංගමයක, සමාජයක හෝ ඒ හා සමාන ආයතනයක නමින්

3. සෑම ගිණුමකටම අංකයක් ලබා දෙනු ලබන අතර, එය බැංකුව සමඟ කරනු ලබන සියලුම ලිපි හුවමාරුවලදී සහ සියලුම තැන්පතු පත්‍රවල සහ මුදල් ආපසු ගැනීමේ ආකෘතිපත්‍ර වල සඳහන් කළ යුතුය. ගිණුම් හිමියාට දැනුම් දීමක් කර එසේ ලබා දෙන ලද අංකය වෙනස් කිරීමට බැංකුවට අයිතියක් ඇත.

4. මෙම ගිණුම, ගිණුම් ප්‍රකාශ මත පදනම් වූ ඉතුරුම් ගිණුමකි. බැංකුවේ අභිමතය පරිදි, සුවිශේෂී අවස්ථාවකදී හැර, මෙම ගිණුම් සඳහා පාස්පොත් නිකුත් කරනු නොලැබේ.

5. ඉතුරුම් ගිණුමේ අරමුණු සඳහා බැංකුව විසින් භාරකාර ආයතන පිළිගනු නොලැබේ.

## විශේෂිත අවස්ථාවකදී නිකුත් කර ඇති පාස්පොත් සඳහා අදාළ වන කොන්දේසි

6. ගිණුම් හිමියා විසින් පාස්පොතෙහි කිසිදු ඇතුළත් කිරීමක් සිදු නොකළ යුතු අතර, අවශ්‍ය වූ විටෙක ගිණුම් හිමියා පාස්පොත බැංකුවට ඉදිරිපත් කළ යුතුය. පාස්පොත වෙනත් අයකුට මාරුකිරීමට හෝ පැවරිය නොහැකි අතර ඇපයක් වශයෙන්ද තැබිය නොහැක.

7. සෑම ගනුදෙනුවක් සිදු කිරීමෙන් පසුව අදාල සටහන් නිවැරදිව ඇතුලත් කර ඇති බව තහවුරු කර ගැනීම සඳහා ගිණුම් හිමියා විසින් පාස්පොත පරීක්ෂා කළ යුතු අතර කිසියම් වැරැද්දක්/අතපසුවීමක් වෙතොත් වහාම ඒ සම්බන්ධයෙන් බැංකුවට දැනුම් දිය යුතුය.

8. පාස්පොත නැතිවූ විට, සොරකම් කරනු ලැබූ විට හෝ විනාශ වූ විට ගිණුම් හිමියා විසින් වහාම ඒ පිළිබඳව බැංකුවට දැනුම් දිය යුතුය.

9. නවතම ඇතුළත් කිරීම් යාවත්කාලීන කිරීම සඳහා පාස්පොත ඉදිරිපත් කිරීමට පෙර තැන්පතු සිදු කර තිබිය හැකි බැවින් හෝ අයිතමයන් අයකර/බැරකර තිබිය හැකි බැවින්, පාස්පොත අනිවාර්යයෙන්ම ගිණුමේ නිවැරදි ශේෂය සඳහන් නොකරනු ඇත.

10. බැංකුව විසින් වරින් වර ගිණුමේ ශේෂ ප්‍රකාශ නිකුත් කරනු ඇත. ගිණුම් හිමියාට බැංකුවෙන් අදාල ප්‍රකාශයේ පිටපත් ඉල්ලා සිටීමට අවශ්‍ය වූ විට, බැංකුවේ ප්‍රකාශිත ගාස්තු අනුව මෙම සේවාව සැපයීම සඳහා ගාස්තුවක් අය කිරීමේ අයිතිය බැංකුව සතුය.

11. පාස්පොත නිතිපතා යාවත්කාලීන කළ යුතුය. අවසන් වරට වූ ගනුදෙනුවක් පිළිබද මාස තුනක් ඇතුළත එම වාර්තා ඇතුලත් කර පාස්පොත යාවත්කාලීන නොකළේ නම්, පිටපතක් හෝ ගනුදෙනු පිළිබද උපදෙස් /විස්තර පසු අවස්ථාවකදී බැංකුවෙන් ඉල්ලා සිටියහොත්, එම සේවාව සැපයීම වෙනුවෙන් ගාස්තුවක් අය කිරීමට බැංකුවට අයිතිය ඇත.

### ගිණුම් ප්‍රකාශ නිකුත් කරන ඉතුරුම් සඳහා පමණක් අදාළවන කොන්දේසි

12. වෙනත් ආකාරයකින් එකඟ වී ඇත්තේ නම් මිස, බැංකුව විසින් තීරණය කරනු ලබන කාල පරතරයන්හිදී, ක්‍රියාත්මක තත්ත්වයක පවතින ගිණුම් සඳහා වරින් වර ගිණුමේ ශේෂ ප්‍රකාශ නිකුත් කරනු ඇත. බැංකුවේ ප්‍රකාශිත ගාස්තු අයකිරීම් වලට අනුකූලව එවැනි ගිණුම්ශේෂ ප්‍රකාශනවල පිටපත් සැපයීම සඳහා ගාස්තුවක් අය කිරීමේ අයිතිය බැංකුව සතුය.

13. ගිණුම්ශේෂ ප්‍රකාශවල පිටපත් සුරක්ෂිතව තබා ගැනීම ගිණුම් හිමියාගේ වගකීමයි. ගිණුම්ශේෂ ප්‍රකාශවල අමතර පිටපත් බැංකුවෙන් ඉල්ලා සිටියහොත්, බැංකුවෙහි ප්‍රකාශිත ගාස්තුවලට අනුකූලව මෙම සේවාව සැපයීම වෙනුවෙන් ගාස්තුවක් අය කිරීමේ අයිතිය බැංකුව සතුවේ.

### තැන්පත් කිරීම්

14. නේෂන්ස් මැක්ස් බෝනස් ඉතුරුම් ගිණුමක් විවෘත කළ හැකි අවම මූලික තැන්පතු මුදල රුපියල් 10,000/- හෝ බැංකුව විසින් කලින් කලට තීරණය කළ හැකි වෙනත් මුදලක් වේ.

15. මුදල් තැන්පතු අවශ්‍ය පරිදි ඕනෑම අවස්ථාවකදී සිදු කළ හැකිය. සියලුම තැන්පතු මුදල් තැන්පතු යන්ත්‍රයකින් සිදු කරන්නේ නම් හෝ තැන්පතු පත්‍රිකාවේ බැංකුවේ බලයලත් නිලධාරියකුගේ අත්සනින් යුතුව පුද්ගලිකව තැන්පත් කරන්නේ නම්, එම මුදල් තැන්පතු ටෙලර් පර්යන්තයක දී විද්‍යුත් වලංගුකරණයකින් යුත් තැන්පතු ස්ලිප් නිකුත් කිරීමෙන් සහ/හෝ පාස්පොතේ (අදාළ නම්) ඇතුළත් කිරීමකින් යොදා භාරගනු ලැබේ.

16. මුදල් තැන්පතු සඳහා පමණක් අවසර ලබා දී ඇත. ඒ හැරුණු විට, බැංකුවේ නමට ලියන ලද සහ ප්‍රතිලාභියාගේ නම සහ ගිණුම් අංකය සඳහන් කර චෙක්පත් මගින් සිදු කරනු ලබන තැන්පත්කිරීම් ශාඛා කළමණාකරුගේ අනුමැතියට යටත්ව පිළිගනු ලැබිය හැකිය. එවැනි චෙක්පත් මගින් තැන්පත් කිරීම් භාරගෙන ඇති අවස්ථාවකදී, චෙක්පත් වලින් ලැබෙන මුදල් (වෙතොත්) එසේ තැන්පත් කරන ලද ගනුදෙනුකරුගේ ගිණුමට බැර කරනු ලැබුවහොත් මිස, (තාවකාලික උපදෙස් ලැබුවද ඒ පිළිබඳව නොසලකා) ශාඛාවේ පිහිටි චෙක්පත් තැන්පත් කිරීමේ පෙට්ටිවල තැන්පත් කර ඇති බව පැවසෙන චෙක්පත් සඳහා බැංකුව ගිණුම් හිමියාට වගකිව යුතු නොවන්නේය.

17. වෙනත් බැංකුවක නමට ලියන ලද කෙටුම්පත් ("බැංකු කෙටුම්පත්") සහ වෙනත් බැංකුවල පවත්වාගෙන යනු ලබන ගිණුමක් යටතේ ලියන ලද චෙක්පත් ("බැංකු චෙක්පත් ") මිලදී ගන්නේ ද නොඑසේනම් එකතු කිරීම සඳහා යවන්නේ ද යන්න බැංකුව තම අභිමතය පරිදි තීරණය කරයි. ගෙවන බැංකුව විසින් පසු අවස්ථාවකදී අගරුවූ මිලදී ගන්නා ලද සියලුම අයිතමයන් සම්බන්ධයෙන් සම්පූර්ණ සහන (ගාස්තු ඇතුළුව) බැංකුව රඳවා ගනු ඇත. අගරු පිළිබඳ දැනුම්දීමක් ලැබීමෙන් පසු ගිණුමෙන් හර කරනු ලැබේ. ගිණුමට බැර කරන ලද චෙක්පත් එකතු කිරීම සඳහා පමණක් පිළිගනු ලබන අතර, එය චෙක්පත් නිකුත් කළ බැංකුව විසින් නිෂ්කාශනය කරනු ලබන තෙක් මුදල් ආපසු ගැනීම සිදු කළ නොහැක. මුදල් ලබා ගත හැකි දිනය පෙන්නුම් කරනු ලබන්නේ ඇඟවීමේ අරමුණු සඳහා පමණි.

18. බැංකුවේ පවත්වාගෙන යනු ලබන ගිණුමක් යටතේ ලියන ලද චෙක්පත් හෝ බැංකුවේ නමට ලියන ලද කෙටුම්පත, ගිණුමේ බැර කිරීම සඳහා ගෙවනු ලබන විට, බැංකුව එහි ප්‍රකාශිත ගාස්තු අයකිරීම්වලට අනුකූලව හැසිරවීමේ ගාස්තු අඩු කරයි. එවැනි තැන්පතු වල ඇගයීම් දිනය බැංකුවේ පවතින ප්‍රතිපත්තිය මත පදනම්ව බැංකුව විසින් තීරණය කරනු ලැබේ. ගිණුමට බැර කිරීම සඳහා වෙනත් බැංකුවක චෙක්පතක් හෝ වෙනත් බැංකුවක කෙටුම්පතක් මිලදී ගත් විට, බැංකුව එය ගිණුමට බැර කිරීමේදී හැසිරවීමේ ගාස්තුවට අමතරව බැංකුව විසින් ප්‍රකාශිත ගාස්තු අයකිරීම්වලට අනුව චෙක්පතේ මුහුණත වටිනාකමෙන් වට්ටම් ගාස්තුවක් අඩු කරයි.

19. ඉහත දක්වා ඇති පරිදි හැර, චෙක්පත් නිෂ්කාශනය කිරීමේදී එය ගිණුමට එකතු කරනු ලබන බවට අදහස් නොකෙරෙන අතර, තැන්පතු චෙක්පත්, කෙටුම්පත්, ලාභාංශ බලපත්‍රය, සහ වෙනත් සාධන පත්‍ර දරන්නාට, ගිණුම් හිමියාට හෝ තෙවන පාර්ශ්වයකුට ගෙවිය යුතු යයි ලියන ලද වෙනත් අයිතමයන් භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බැංකුව සතුවේ.

**මුදල් ආපසු ගැනීම්**

20. ගිණුම් හිමියා විසින් ගිණුමෙන් මසකට මුදල් ආපසු ගැනීම් 1කට වඩා වැඩි ප්‍රමාණයක් සිදු කර ඇත්නම්, පහත 23 වැනි වගන්තියට අනුව ගිණුම් හිමියාට ප්‍රසාද පොලී සඳහා හිමිකම් නොලැබෙන අතර බැංකුවේ අභිමතය පරිදි මෙම සීමාව කලින් කලට වෙනස් වීමට ලක්විය හැකිය.

21. වෙනත් බැංකුවල ATM යන්ත්‍ර වලින් මුදල් ආපසු ගැනීම් ඇතුළුව මුදල් ආපසු ගැනීම් හා සම්බන්ධ සියලුම ගාස්තු බැංකුවේ ප්‍රකාශිත ගාස්තු අයකිරීම් අනුව ගෙවිය යුතුය.

22. මෙහි අඩංගු විධිවිධාන වලට යටත්ව, බැංකුව ක්‍රියා කරනුයේ ගිණුමේ හරයට ගෙවීම් සිදු කිරීම සඳහා තැපෑලෙන් ලැබී ඇති හෝ බැංකුවේ ඕනෑම ශාඛාවකට සාධාරණ කාලයක් තුළ භාරදී ඇති ලිඛිත උපදෙස් (ස්ථාවර උපදෙස් ඇතුළුව) මත පමණි. බැංකුව සහ ගිණුම් හිමියා අතර නිශ්චිත ගිවිසුමක් නොමැතිව ෆැක්ස්, විද්‍යුත් තැපෑල හෝ වෙනත් විද්‍යුත් මාධ්‍ය හරහා ලැබෙන කිසිදු උපදෙසක් බැංකුව විසින් පිළි නොගැනේ. මතු දැක්වෙන වගන්තිවල භාවිතා කර ඇති පරිදි "මුදල් ආපසු ගැනීම්" යන යෙදුමට, එවැනි ගිණුමකට හර කිරීමට හේතු වන ගිණුමක් හරහා සිදුවන ඕනෑම ගනුදෙනුවක් ද ඇතුළත් වේ.

**පොලිය**

23. දෛනිකව පවතින ශේෂය මත වත්මන් අනුපාතයට ගණනය කරනු ලබන පොලිය මාසිකව (සාමාන්‍යයෙන් මාසයේ අවසාන දිනයේ දී) ඉතුරුම් ගිණුමට බැර කරනු ලැබේ.

24. 23 වැනි වගන්තියේ දක්වා ඇති පොලිය අමතරව, ගිණුම් හිමියා බැංකුව විසින් කලින් කලට නියම කරනු ලබන අවම මාසික ශේෂය පවත්වාගෙන යන්නේ නම්, එවැනි ප්‍රසාද පොලිය මාසිකව (සාමාන්‍යයෙන් මාසයේ අවසාන දිනයේ) ගිණුමට බැර කරනු ලැබේ.

25. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් හෝ එවැනි කාර්යයන් සඳහා නීතියෙන් නම් කරන ලද වෙනත් අධිකාරියක් විසින් නිර්දේශ කර ඇති පරිදි රඳවාගැනීමේ බද්ද හෝ පොලී ගෙවීම් මත ගෙවිය යුතු වෙනත් ඕනෑම බද්දක් අදාළ කාලසීමාව සඳහා (එවැනි අනුපාතයකට හෝ අනුපාතවලට) ගෙවිය යුතු පොලියෙන්'බැංකුව විසින් අඩු කරනු ලැබේ. අදාළ අධිකාරිය විසින් පසුව හිමිකම් පෑමක් කරනු ලැබුවහොත්,

දැනුම් දීමකින් තොරව ඕනෑම අවස්ථාවකදී නොගෙවා ඇති බදු ගිණුම් හිමියාගෙන් අය කර ගැනීමට බැංකුවට අයිතියත් ඇත.

**පොදු**

26. ගිණුමේ ශේෂය රු. 1,000/- කට වඩා හෝ බැංකුව විසින් කලින් කලට නියම කරනු ලබන වෙනත් මුදල් ප්‍රමාණයකට වඩා අඩුවුවහොත්, බැංකුවට තම අභිමතය පරිදි බැංකුව විසින් ප්‍රකාශිත ගාස්තු අයකිරීම්වලට අනුව සේවා ගාස්තුවක් අය කිරීමට සහ/හෝ ප්‍රසාද පොලී ඇතුළුව පොලිය රඳවා තබා ගැනීමට හෝ අඩු කිරීමට හැකිය

27. අවම ශේෂ ගාස්තුව අයකර ගැනීමට ප්‍රමාණවත් අරමුදල් නොමැති අවස්ථාවක, එවැනි එකතුවී ඇති ගාස්තු වහාම ගිණුමේ ඇති ප්‍රමාණවත් මුදලෙන් අයකර ගැනීමට බැංකුවට අයිතියක් ඇත.

28. ඕනෑම අවස්ථාවක ගිණුමේ ශේෂය ශුන්‍ය වූවහොත් හෝ අවම ශේෂ ගාස්තුවට වඩා අඩු වුවහොත්, ගිණුමක් අත්හිටුවීමේ අයිතිය බැංකුවට ඇත.

29. බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී ඕනෑම වේලාවක දැනුම් දීමක් කර ගිණුම වසා දැමීමට බැංකුවට අයිතියක් ඇත.

30. ගිණුම විවෘත කළ දින සිට මාස තුනක කාලයක් ඇතුලත ගිණුම් හිමියා විසින් ගිණුම වසා දැමුවහොත්, බැංකුවේ ප්‍රකාශිත ගාස්තු අයකිරීම් අනුව පවතින ශේෂයෙන් හැසිරවීමේ ගාස්තුවක් අඩු කිරීමට සහ/හෝ ප්‍රසාද පොලිය ඇතුළුව පොලිය රඳවා තබා ගැනීමට හෝ අඩු කිරීමට බැංකුවට අයිතියත් ඇත.

31. මෙම නියමයන් සහ කොන්දේසි වලට අනුකූලව ගිණුම් හිමියා විසින් ගෙවිය යුතු ඕනෑම අයකිරීමක් සහ/හෝ බද්දක් වත්මන් මාසය තුළ හෝ ඊළඟ මාසයේදී හෝ ගිණුම වසා දැමීමට පෙර අයකර ගැනීමට ගිණුම් හිමියා බැංකුවට සිය කැමැත්ත ප්‍රකාශ කර ඒ සඳහා බලය පවරයි.

32. ඕනෑම අවස්ථාවක මෙම නියමයන් සහ කොන්දේසි සංශෝධනය කිරීමට බැංකුවට අයිතියක් ඇත, එය එහි අභිමතය පරිදි වන අතර එවැනි ඕනෑම සංශෝධනයක් ගිණුම් හිමියා බන්ධනය කරයි. එවැනි සංශෝධන පිළිබඳ දැනුම්දීම (ඇත්නම්) බැංකුව විසින් එහි සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී ලබා දෙනු ඇත.

33. බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී ගිණුම් හිමියාට දැනුම් දීමක් කර ඕනෑම අවස්ථාවක දී නේෂන්ස් මැක්ස් බෝනස් සේවා සැලසුම ඉල්ලා අස්කර ගැනීමේ අයිතිය බැංකුව රඳවා තබා ගනී. එම ගිණුම පාලනය වන නියමයන් සහ කොන්දේසි වලට යටත්ව බැංකුව විසින් නියම කරන ලද ගිණුම් කාණ්ඩයකට එකී ගිණුම මාරු කරනු ලැබේ.

34. නීතිය, රජයේ රෙගුලාසි හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් පරිදි සංශෝධනයක් සිදු කිරීම අවශ්‍ය වන්නේ නම්, මෙම නියමයන් සහ කොන්දේසි ඒ අනුව ස්වයංක්‍රීයව සංශෝධනය වනු ඇත.

35. ගිණුම් හිමියාගේ ගිණුම බැංකුව කෙරෙහි ඇති ගිණුම් හිමියාගේ වෙනත් ඕනෑම ගිණුමක් හෝ වගකීමක් සමඟ ඒකාබද්ධ කර හෝ එකට එක යා කර, ගිණුමේ බැර වී ඇති ඕනෑම මුදලක් ගිණුම් හිමියාගෙන් බැංකුවට අයවිය යුතු වෙනත් ඕනෑම මුදලක් වෙනත් ඕනෑම ගිණුමකට හෝ වෙනත් ඕනෑම ආකාරයකින්, එවැනි වගකීම් සත්‍ය හෝ අවිනිශ්චිත, එක්ව හෝ වෙන් වෙන්ව , පැවරීමට හෝ මාරු කිරීමට ගිණුම් හිමියා මෙයින් එකගත්වය පළ කර ඒ සඳහා බැංකුවට බලය පවරනු ලබයි.

36. බැංකුවේ අදහසට අනුව සම්ප්‍රේෂණය කිරීම්, ගබඩා කිරීම් සහ/හෝ ප්‍රවේශවීම් අවශ්‍ය වේ නම්, ගිණුම් හිමියාගේ අදාළ ගිණුම් පිළිබද තොරතුරු ඇතුළු සියලුම දත්ත ඕනෑම ස්ථානයක එසේ සම්ප්‍රේෂණය කිරීමට සහ / හෝ ගබඩා කිරීමට හෝ ර දවා තබා ගැනීමට සහ බැංකුවේ බලයලත් නිලධාරීන්, ඕනෑම දත්ත සැකසුම් සේවාවක් සපයන පුද්ගලයින් සහ/හෝ ගිණුම් ප්‍රකාශයන් මුද්‍රණය කිරීම සහ තැපැල් කිරීම හෝ ඒ හා සමාන සේවාවන් සැපයීම සඳහා බැංකුව විසින් පත්කර ඇති ඕනෑම තෙවන පාර්ශ්වයකට එම තොරතුරුවලට ප්‍රවේශ විය හැකි බවට ගිණුම් හිමියා එකඟත්වය ප්‍රකාශ කර ඒ බව දන්වා සිටියි.

37. මීළඟ කාලානුරූපී ශේෂ ප්‍රකාශය නිකුත් කිරීමට පෙර හෝ පසුව හෝ පාස්පොත යාවත්කාලීන කිරීමට (අදාළ වුවහොත්) පෙර හෝ පසුව ඕනෑම ගිණුමකට කරන ලද වැරදි ඇතුළත් කිරීම්, හර ඇතුළත් කිරීම (Reverse Entry) මගින් බැංකුව විසින් ආපසු හැරවීමට, නිවැරදි කිරීමට හෝ අවලංගු කිරීමට හැකිය.

38. මෙහි අඩංගු නියමයන් සහ කොන්දේසි වලට අමතරව බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාරික කොන්දේසි වල අන්තර්ගත නියමයන් සහ කොන්දේසි වලට මෙම ගිණුම් හිමියා බැඳී සිටී. මෙම නියමයන් සහ කොන්දේසිවල විශේෂයෙන් ආවරණය නොවන ඕනෑම කරුණක් සඳහා ගිණුම් හිමියා සාමාන්‍ය ව්‍යාපාර කොන්දේසි කියවා බැලිය යුතුය.

44. මෙම නියමයන් සහ කොන්දේසි ශ්‍රී ලංකාවේ නීති මගින් පාලනය වන අතර ගිණුම් හිමියා ශ්‍රී ලංකාවේ අධිකරණවල සුවිශේෂී අධිකරණ බලයට යටත්වනු ඇත.

නේෂන්ස් මැක්ස් බෝනස් සේවා ගිණුම් සැලැසුමට අදාළ මෙම නියමයන් සහ කොන්දේසි සහ විස්තර මෙහි අත්සන් කිරීමට පෙර මා/අප වෙත ලබා දී පැහැදිලි කරන ලද බවට මම/අපි මෙයින් තහවුරු කරන අතර මම/අපි එම විස්තර සහ මෙම නියමයන් සහ කොන්දේසි කියවා තේරුම් ගෙන එකඟ වී ඇති අතර එවාට බැඳී සිටීමට කැමැත්ත ප්‍රකාශ කරමි/කරමු.

………………………………………… ……………………………………..

ගනුදෙනුකරුගේ අත්සන ගනුදෙනුකරුගේ අත්සන

………………………………………… ……………………………………..

ගනුදෙනුකරුගේ අත්සන ගනුදෙනුකරුගේ අත්සන